# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,226 - 2021 අප්‍රේල් මස 30 වැනි සිකුරාදා - 2021.04.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 990 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1037 |


සැ. යු.- හදිසි මහජන සෞඛ්‍ය පනත් කෙටුම්පත 2021 අප්‍රේල් මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට නෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 මැයි මස 21 වැනි දින පළකරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2021 මැයි මස 07 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

ගංගානි ලියනගෙ,
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


987 - B 82226 — 5,403 (2021/04)
B I -

# තනතුරු - ඇබෑර්තු

## ශ්‍රී ලංකා පොලීසිය

### උප පොලිස් පරීක්ෂක තනතුර - විශේෂ කාර්ය බලකාය

ශ්‍රී ලංකා පොලීසියේ විශේෂ කාර්ය බලකායට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුරට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් සෘජුවම අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට හෝ අණදෙන නිලධාරී, විශේෂ කාර්ය බලකා මූලස්ථානය, අංක 223, බෞද්ධාලෝක මාවත, කොළඹ 07 ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම් කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2021.06.30 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයකට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලීසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* : (මාසිකව)

රු. 32,790 - 7 x 370 - 2 x 495 - 25 x 660 - රු. 52,870.

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි II උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තව ද, මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | | |
|---|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. | 7,800 0 |
| (ආ) | අන්තර් දීමනාව | රු. | 2,500 0 |
| (ඇ) | මූලික වැටුපට 40% දීමනාව | රු. | 13,116 0 |
| | මූලික වැටුපට 33% දීමනාව | රු. | 10,820 70 |
| (ඉ) | දිරි දීමනාව | රු. | 1,500 0 |
| (ඊ) | සංයුක්ත දීමනා | රු. | 12,000 0 |
| (උ) | වෙනත් දීමනා | රු. | 6,123 0 |
| (ඌ) | දුෂ්කර දීමනාව | රු. | 2,000 0 |
| (එ) | විවාහක දීමනාව | රු. | 300 0 |
| (ඒ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. | 250 0 |

මෙම දීමනාවලට අමතරව -

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

(ඉ) රාජකාරී සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.

(ඊ) විශේෂ කාර්ය බලකායේ මූලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනිකුත් නිලධාරීන්ට ගෙවනු ලබන විශේෂ දීමනාවලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

4:1 *වයස් සීමාව* :

*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-26 ත් අතර විය යුතු ය.

එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලීසියේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 28 දක්වා අයදුම් කළ හැකිය.

4:2 *අධ්‍යාපන සුදුසුකම්* :

- අධ්‍යයන පොදු සහතිකපත්‍ර සාමාන්‍ය පෙළ විභාගයෙන් මාධ්‍ය භාෂාව සහ ගණිතය විෂයයන් ඇතුළුව සම්මාන සාමාර්ථ 04ක් සහිතව එක්වරක දී විෂයයන් හයක් සමත්වීම ;

සහ

- අධ්‍යයන පොදු සහතිකපත්‍ර උසස් පෙළ විභාගයෙන් එක්වරක දී විෂයයන් තුනකින් සමත්වී තිබීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සටහන 01- **ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂයය වර්ගීකරණය අනුව විෂය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයක් ලෙස ද අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයක් වශයෙන් ද සලකා විභාගයෙන් සමත් විෂය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.**

සටහන 02 - **අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.**

සටහන 03- **වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයක් ලෙස ගණනය කරනු නොලැබේ.**

4:3 *කායික සුදුසුකම්* :

- උස අඩි 05 අඟල් 06 (අවම),
- පපුව අඟල් 32 (අවම/හුස්ම නාල්ලා).

4.3.1 සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

4.3.2 *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්*.— උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච නොමැතිව එක් එක් ඇසෙහි අවම දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. එක් ඇසක දෘෂ්ටිය 6/6 වන විට අනෙක් ඇසෙහි 6/18 ක් විය යුතුය.

4.3.3 පොලිස් සේවයේ ගරුත්වයට නොගැලපෙන හා රාජකාරිවලට බාධා විය හැකි අන්දමේ කෘත්‍රිම ශාරීරික වෙනස්කම් කර නොතිබිය යුතුය.

4.4 *වෙනත් සුදුසුකම්* :

4.4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

4.4.2 අයදුම්කරු අයහපත් චරිතයකින් යුක්ත නොවිය යුතුය.

4.4.3 අයදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්, වැන්දඹුවන්, සහ අවිවාහකව දරුවන් සිටින අයවලුන් සුදුසුකම් නොලබයි.)

4.4.4 දැනට සේවයේ යෙදී සිටින නිලධරයන්ට මෙය අදාල නොවේ.

4.4.5 දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට බැඳී සිටිය යුතුය.

4.4.6 තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන 4.1 සහ 4.2 යන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් දිනට සම්පූර්ණ කර තිබිය යුතු අතර 4:4 හි සුදුසුකම් බඳවා ගන්නා දිනට ද ඒ ආකාරයෙන්ම තිබිය යුතුය.

05. *මූලික පරීක්ෂණය* :

අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් අතරින් මූලික සුදුසුකම් සහ වයස සපුරා ඇති අයදුම්කරුවන් පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේ දී ඉහත ඡේද 4.3 (4.3.2 හා 4.3.3. හැර) හා 4.4 (4.4.2 හා 4.4.4 හැර) සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ.

මූලික පරීක්ෂණයට පෙනී සිටින අයදුම්කරුවන් පොලිස්පති විසින් පත්කරනු ලබන මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ඔරොත්තු දීමේ පරීක්ෂණයට පෙනී සිටිය යුතුය. අයදුම්කරුවන් විසින් ඔරොත්තු දීමේ පරීක්ෂණයට මුහුණදීමට සුදුසු බවට කැඳවීම් ලිපිය සමග අමුණා එවනු ලබන පෝරමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වෛද්‍යවරයෙකුගේ නිර්දේශය සහිතව එම අවස්ථාවේ දී ඉදිරිපත් කළ යුතු ය.

❖ *ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය* :

| *ක්‍රියාකාරකම* | *කාලය* | *ලකුණු* |
|---|---|---|
| දුර දිවීම මීටර්/ Run meters 1000 | විනාඩි 03ට අඩුනම් | 30 |
| | විනාඩි 03ත් 04ත් අතර | 20 |
| | විනාඩි 04ත් 05ත් අතර | 10 |
| Chinup (වාර 05ක්) | විනාඩි 01 යි | එක් වාරයකට ලකුණු 03 බැගින් උපරිම ලකුණු 15 කි |
| Pushup (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Situp (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Squat Thrust (වාර 15ක්) | විනාඩි 01 යි | වාරයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 15කි |
| Kim Gem (මතකය පරීක්ෂා කිරීම) | අයිතමයන් නිරීක්ෂණය කිරීම සඳහා තත්පර 30 යි, ධාරණය කර ගැනීමට තත්පර 30යි, ලිවීමට තත්පර 120 යි | එක් අයිතමයකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 10 යි |

- ආත්ම විශ්වාසය පරීක්ෂා කිරීමේ පරීක්ෂණය (බාධක තරණ අභ්‍යාස)
- ආරම්භක ශක්තිය හා ප්‍රතිචාර දැක්වීමේ පරීක්ෂණය

සටහන : මීටර් 1000 ක දුරක් විනාඩි 05ක කාලයක දී දිවීමට අසමත් වන අයදුම්කරුවන් යෝග්‍යතා පරීක්ෂණයෙන් අසමත් ලෙස සලකනු ලබන අතර, ඉහත අභ්‍යාසවල මුළු ලකුණුවලින් 60%ක් ලබාගැනීම යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් කඩඉම් ලකුණු ප්‍රමාණය ලෙස සලකනු ලැබේ..

06. *ලිඛිත විභාගය* :

මූලික පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් ලිඛිත විභාගය සඳහා කැඳවනු ලැබේ. ලිඛිත විභාගය පහත විෂයයන් යටතේ පවත්වනු ලැබේ.

| *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *කාලය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. අවබෝධය හා භාෂා හැකියාව | 40 | වි. 45 | 40% |
| 02. සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | 60 | පැය 01 | |